කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය 2017/2018

**HIS 3268 - ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ජාතිය සහ දෘෂ්ටිවාදය**

කාලය පැ <u>(02) දෙකයි</u>

ප්‍රශ්න **<u>තුනකට (03)</u>** පමණක් පිළිතුරු සපයන්න.
මෙය විවෘත විභාගයකි. සිසුන්ට **මුද්‍රිත පිටපත්** රැගෙන ඒමට අවසර ඇත.

---

1. සිමොන් දෙ බුවාට (Simon de Beauvoir) අනුව "ස්ත්‍රී පුරුෂ සමාජභාවය යනු ක්‍රමානුකූලව අත්පත් කර ගන්නා අනන්‍යතාවයේ එක් ආකාරයකි". මේ කියමන සාකච්ඡා කරන්න.

2. "ස්ත්‍රී පුරුෂ සමාජභාවය රඟදැක්වීමක්" යැයි ජුඩිත් බට්ලර් (Judith Butler) පවසන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.

3. පාර්ත චැටර්ජිට (Partha Chatterjee) අනුව 19 වැනි ශත වර්ෂයේ ඉන්දියාවේ ජාතික ව්‍යාපාරයෙන් ඉන්දියානු කාන්තාවට නව අනන්‍යතාවක් නිර්මාණය කෙරිණි. මේ ප්‍රකාශය විවේචනාත්මකව විමසන්න.

4. 19 වැනි ශතවර්ෂයේ අග භාගයේ ධර්මපාල විසින් ලියුණු ලැබූ "ගිහි දින චරියාව" සිංහල කාන්තාව තුළ "ලැජ්ජා බය" පිළිබඳ සංකල්පය වර්ධනය කිරීමට දායක වූ ආකාරය පැහැදිලි කරන්න.

5. පහත සඳහන් මාතෘකා දෙකක් (02) පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   අ. ජාතික රාජ්‍යය
   ආ. පශ්චාත් යටත්විජිතවාදී ස්ත්‍රීවාදය
   ඇ. දෘෂ්ටිවාදය
   ඈ. පුරුෂ භාවය

6. 10 වැනි ශ්‍රේණියේ සිංහල භාෂාව හා සාහිත්‍යය අත් පොත ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ලාංකේය සමාජයේ පවතින දෘෂ්ටිවාද ප්‍රතිනිෂ්පාදනය කරන්නේ කෙසේදැයි විස්තර කරන්න.